**අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

2014 සහ 2015 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශවලට අනුව විනාශ කළ පොත් 125 ක පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

#### 1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්ති | ප්‍රාදේශීය සභාවල කාර්යයන් පහසු කිරීමේ අරමුණෙන් නිවැරදි තීරණ ලබාගැනීම සඳහා මූල්‍ය හා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිවාස ඉදිකිරීම සහ සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පරිසර හා පොදු පහසුකම් යනාදී විෂයයන් සඳහා වෙනම කණ්ඩායම් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.6,006 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,603,549 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,597,543 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,000 | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 1,800,000 | 1,472,413 | 1,472,413 | - | 1,711,725 | 1,885,355 | 1,885,355 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 274,000 | 374,000 | 374,000 | - | 182,000 | 313,150 | 313,150 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 3,365,000 | 2,032,549 | 1,601,956 | 1,010,326 | 2,108,000 | 3,427,440 | 3,838,892 | 579,734 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු ආදායම රු.4,458,696 ක වටිනාකමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,448,369 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 77% ක් වශයෙන් දැක්වුණි.

**2.2.3 වරිපනම් හා බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාරික ස්ථාන 368 ක් සහ නිවාස 4,673 ක් මත 2010 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.2,520,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.2.4 උසාවි දඩ**

2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හිඟ මුදල් රු.993,701 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ කාර්යාලය, පුස්තකාල, පොදු වෙළඳපොල සහ ක්‍රීඩා පිටිය ආදිය පිහිටා ඇති සභාවට අයත් පර්චස් 505 ක වපසරියක පැවැති ඉඩම් 07 සඳහා හිමිකම් ඔප්පු සභාව විසින් ලබාගෙන නොතිබුණි.

(ආ) සභාව සතු වාහන සඳහා ආදායම් බලපත්‍ර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂ අවසානය දක්වා නියමිත කාලය තුළ ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් දඩ ගාස්තු ලෙස රු.15,920 ක් ගෙවා තිබුණි.

(ඇ) සභාව සතුව වාහන 14 ක් පැවතියද එම වාහන සඳහා රියදුරන් 03 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබීම හේතුවෙන් එම වාහන සභාවේ කාර්යයන්ට යොදා ගත නොහැකිව පැවතුණි.

**3.2 පුස්තකාල කාර්යයන්**

ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂය සඳහා වන අයවැය සැලැස්මට අනුව, මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම වෙනුවෙන් රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත් සමාලෝචිත වර්ෂයේ දී රු.18,070 ක් වටිනා පොත් පමණක් මිලදී ගෙන තිබුණි. තවද, පාඨක අවශ්‍යතාවයන්ට සුදුසු ආකාරයේ පොත් මිලදී ගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.3.1 මර ආලෙයි මාර්ගය ප්‍රතිසංස්කරණය

ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ රු.1,501,668 ක වියදමින් මර ආලෙයි මාර්ගයට කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කර තිබුණත්, 2018 මාර්තු 02 දින දක්වා මාර්ගය දෙපසෙහි 20.65 $m^3$ ප්‍රමාණයේ රු.18,998 ක් වටිනා බොරළු නොදමා තිබියදී ගෙවීම් සිදුකර තිබුණි.

### 3.3.2 වායික්කාල් මාර්ගයට කොන්ක්‍රීට් දැමීම

ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයේ නෙල්සිප් සැලැස්ම යටතේ රු.1,500,000 ක ප්‍රතිපාදනයෙන් වායික්කාල් මාර්ගයට කොන්ක්‍රීට් දැමීමට ප්‍රජා මධ්‍යස්ථානයක් සමඟ සභාව රු.1,499,458 ක වටිනාකමට ගිවිසුම් සඳහා එළඹ තිබුණි. එසේ වුවද, ප්‍රසම්පාදන අත්පොතේ 3.9.1 වගන්තියට පටහැනිව මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුත්ත ප්‍රජා මධ්‍යස්ථානය විසින් වෙනත් ආයතනයක් සමඟ උප ගිවිසුම්ගත වීමෙන් අනතුරුව සම්පූර්ණ කර තිබුණි. තවද, සභාවේ තාක්ෂණ නිලධාරී සමඟ සෘජුවම මාර්ගය සෝදිසි කළ අවස්ථාවේදී ගෙවීම් සිදුකළ මාර්ගයේ මිනුම් සමඟ සන්සන්දනය කිරීමේදී තථ්‍ය මිනුම් ප්‍රමාණය 2.48 $m^3$ කින් අඩුවෙන් දක්නට ලැබූ හෙයින් රු.37,992 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ලැයිස්තු අංකය | ගෙවීම් සිදුකර තිබුණි | | | සත්‍ය වශයෙන් දක්නට ලැබූ මිනුම් ප්‍රමාණය අනුව | | | වැඩියෙන් ගෙවීම් |
|---|---|---|---|---|---|---|---|
| | ඒකක ප්‍රමාණය | මිල | එකතුව | ඒකක ප්‍රමාණය | මිල | එකතුව | |
| | | රු. | රු. | | රු. | රු. | රු. |
| 04 | $84m^3$ | 14,070 | 1,181,880 | $81.52m^3$ | 14,070 | 1,146,986 | 34,894 |
| 05 | $53m^2$ | 690 | 24,150 | $30.5m^2$ | 690 | 21,052 | 3,098 |
| | | | | | | | 37,992 |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය සැලැස්මෙන් සභාවේ ප්‍රතිපාදනවලින් සභාවේ මේ දක්වා කාලය සඳහා ඉටු නොකළ මාර්ග, කාණු පද්ධති නියමිත ආකාරයෙන් ඉදිකිරීමටත්, පුස්තකාල තුන සංවර්ධනය කිරීමටත් තීරණය කර තිබුණත්, මෙම සංවර්ධන කාර්යයන් සඳහා සභාවේ ප්‍රතිපාදනවලින් රු.70,717 ක් පමණක් වැය කර තිබූ අතර ප්‍රදේශයේ සංවර්ධනය අරමුණු කරගනිමින් භෞතික සහ සෞඛ්‍ය සේවාවන් සම්බන්ධයෙන් සභාව විසින් අර්ථාන්විත සැලසුම් යෝජනා කර නොතිබුණි.

## 4.2 නිරවුල් නොකළ විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව, මහනගර සභාවක් හා ප්‍රාදේශීය සභාවක් ලෙස කළමනාකරණ ඒකක දෙකක් වශයෙන් වෙන් කිරීමේදී නිසි අනුමැතියකින් තොරව මුළු එකතුව රු.25,808,155 ක් වටිනා වත්කම් සහ මුළු එකතුව රු.2,398,775 ක් වටිනා වගකීම් ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ආලිම් නගරයේ අභ්‍යන්තර මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා කොන්ත්‍රාත්තු ප්‍රජා මධ්‍යස්ථානයකට භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන්, සභාවේ තාක්ෂණික නිලධාරියාගේ ලිඛිත සනාථ කිරීම අනුව අදාළ කාර්යය සඳහා සභාවේ මෝටර් ග්‍රේඩරය (Motor Grader) භාවිතා කර තිබුණත් එම මෝටර් ග්‍රේඩරය මඟින් සිදුකළ කාර්යයන් සඳහා කළ ගෙවීම් රු.42,000 සභාව ප්‍රජා මධ්‍යස්ථානයටම ගෙවා තිබුණි.

(ඇ) සභාවේ JCB යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ අනතුරකට ලක්වීමෙන් රු.115,128 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණි. මෙම වියදමින් රක්ෂණ ආයතනයෙන් රු.37,500 ක් වන්දි ලැබී තිබුණි. එසේ වුවත්, සභාව විසින් මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 (1) ප්‍රකාරව පොලිසියේ පැමිණිලි කිරීම සහ විමර්ශණයක් සිදු කොට අලාභය ගණනය කර එයට වගකිව යුතු අය තීරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) ජල සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් අක්කරෙයිපත්තු ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලයට 2016 වර්ෂයේදී සියයට 11 ක එකතු කල අගය මත බදු වෙනුවට සියයට 15 ක එකතු කළ අගය මත බදු මුදල් ගෙවා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.34,749 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) කොන්ත්‍රාත් පිරිනැමීමේදී උප කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්ගත නොවන ප්‍රජා මධ්‍යස්ථාන කෙරෙහි අවධානය යොමු කිරීම.<br>(ii) පිළිගත හැකි කාරණා සඳහා පමණක් කාලය දීර්ඝ කිරීම් ලබාදීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |